# ව්‍යාපාරය-

විවිධ මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම සඳහා පිහිටුවා ගත් සංවිධාන ව්‍යාපාර වේ.නිෂ්පාදනය,බෙදාහැරීම සහ සේවා සැපයීම ව්‍යාපාරවලින් සපුරාලනු ලබන කාර්යයන් අතර වේ.

## ඇල්මැති පාර්ශවයන්-

තීරණ ගැනීම සඳහා ව්‍යාපාරයක මූලාය හා මූලාය නොවන තොරතුරු කෙරෙහි අවධානය යොමු කරන අභ්‍යන්තර,බාහිර පාර්ශවයන්

__අයිතිකරුවන්-__

ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් ආයෝජනය කරන ලද පුද්ගලයා හෝ පුද්ගල කණ්ඩායම

ඔවුන් ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන්නේ,

- ආයෝජනය සඳහා ප්‍රමාණවත් ලාභයක් ලැබේද යන්න,
- අනාගත ආයෝජන පිළිබඳව තීරණ ගැනීම(ආයෝජනය තවදුරටත් පවත්වාගෙන යන්නේද/ඉවත් කරන්නේද) දැනගැනීමට

## කළමනාකරුවන්-

ව්‍යාපාරයක කළමනාකරණ කටයුතු ඉටුකරන පුද්ගලයන් කළමනාකරුවන් ලෙස නම් කෙරේ.

ඔවුන් ව්‍යාපාර පිළිබඳ ඇල්මක් දක්වන්නේ,

- ව්‍යාපාරයේ සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න තහවුරු කර ගැනීමට
- ව්‍යාපාරයේ අනාගත වර්ධනය වෙනුවෙන් සැලසුම් සකස් කිරීමට
- ගන්නා ලද තීරණවල සාර්ථක අසාර්ථක බව මැන බැලීමට

සේවකයන්-

ව්‍යාපාරයේ දෛනික මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම වෙනුවෙන් කායික හා මානසික ප්‍රයත්නයක් යොදවන පුද්ගලයන්,

ඔවුන් ව්‍යාපාර පිළිබඳ ඇල්මක් දක්වන්නේ,

- රැකියාවේ ස්ථාවරත්වය තහවුරු කර ගැනීමට
- වැටුප් වර්ධක ලබා ගැනීමට ඇති හැකියාව දැන ගැනීමට
- කම්කරු නීතිරීති සම්බන්ධයෙන් ආයතනයේ පරිචය දැන ගැනීමට

## රාජ්‍ය ආයතන-

ව්‍යාපාරික කටයුතු මනා ලෙස හැසිරවීම සඳහා රජය විසින් නීති රෙගුලාසි පනවයි.එම කටයුතු නිරීක්ෂණය සහ නියාමනය වෙනුවෙන් විවිධ ආයතන පිහිටුවීම සහ නිලධාරීන් පත් කිරීම රජය සිදු කරයි.

ඔවුන් ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන්නේ,

- බදු ගණනය කිරීමේ සහ බදු ගෙවීමේ නිරවද්‍යතාවය සනාථ කර ගැනීමට
- වාර්තා ලබා දිය යුතු ආයතන වෙත එම වාර්තා නියමිත පරිදි ලබා දී ඇති බව විමසීමට
- ව්‍යාපාර සාධාරණ මිල ගණන් යටතේ භාණ්ඩ බෙදා හරින බව තහවුරු කර ගැනීමට

ගනුදෙනුකරුවන්-

# ව්‍යාපාර ආයතන වෙතින් නිෂ්පාදිත මිලදී ගනු ලබන පුද්ගල කණ්ඩායම ගනුදෙනුකරුවන්ය.

**ණය හිමියන් සහ ණය සපයන ආයතන-**

ව්‍යාපාර වෙත අවශ්‍ය අමුද්‍රව්‍ය සහ අනෙකුත් දේවල් සැපයීම් කරන ආයතන සැපයුම්කරුවන්/ණයහිමියන් ලෙසද මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා ණය හෝ මූල්‍ය පහසුකම් ලබා දෙන ආයතන ,ණය සපයන ආයතන ලෙසද හැඳින්වේ.

ඔවුන් ව්‍යාපාර පිළිබඳව ඇල්මක් දක්වන්නේ,

- ණය ආපසු අය කර ගැනීමේ හැකියාව තක්සේරු කිරීමට
- ලබා දී ඇති ණය,මූල්‍ය පහසුකම් වැඩි කිරීමේ හැකියාව තක්සේරු කිරීමට

ඉහත සියලු පාර්ශවයන්, පොදුවේ සමස්ත පොදු ජනතාව ව්‍යාපාරික කටයුතු සහ ව්‍යාපාරවල පැවැත්ම පිළිබඳව සැලකිලිමත් වේ.නමුත් එහි සෑම පාර්ශවයකටම තම අවශ්‍යතාව මත ව්‍යාපාරවල තොරතුරු ලබා ගැනීමේ හැකියාවක් නොපවතී.එම පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ලෙස ගිණුම්කරණය භාවිතා වේ.

ගිණුම්කරණය-

ඇල්මැති පාර්ශවයන් වෙත ව්‍යාපාර ඒකකයක් පිළිබඳ ආර්ථික තොරතුරු ලබා දීමේ ක්‍රියාවලිය වේ.

ගිණුම්කරණයේ අරමුණ-

ඇල්මැති පාර්ශවයන්ට ආර්ථික තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.

# ගිණුම්කරණ ඒකකය

පුද්ගලයෙක්,ව්‍යාපාර ආයතනයක්,රජයක් හෝ ඔ්නෑම සංවිධානයක් ගිණුම්කරණ ඒකකයක් ලෙස සැලකේ.

# මූලාශ්‍රමය තොරතුරු

ගිණුම්කරණ ඒකකයකට අදාළ මූලාශ්‍රමය තොරතුරු ආර්ථික තොරතුරු ලෙස සැලකේ.

උදා-

පෙර වර්ෂයේ දළ ලාභය රු.300,000

අයිතිකරු විසින් ආයෝජිත ප්‍රාග්ධනය රු.1,500,000

සේවකයන්ට ගෙවූ වැටුප් රු.40,000

# මූලායමය නොවන තොරතුරු

ව්‍යාපාර පිළිබඳව තීරණ ගැනීමේදී වැදගත්වන මූලායමය නොවන තොරතුරු ද පවතී.

උදා-ව්‍යාපාරයේ සේවක සංඛ්‍යාව 250කි.

ව්‍යාපාරය පිහිටා ඇති ස්ථානය

නම් දැරූ ව්‍යාපාරිකයෙකු සමාගමේ සභාපති ලෙස රාජකාරි ඇරඹීම.

# ගිණුම්කරණයේ ප්‍රභේද

තොරතුරු භාවිතාකරන පාර්ශව අනුව ගිණුම්කරණය ප්‍රධාන වශයෙන් මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය ලෙස ප්‍රභේද දෙකකට වර්ග කෙරේ.

# මූලාය ගිණුම්කරණය

සම්මත රීතීන්ට අනුකූලව ව්‍යාපාරයක සිදු වූ මූලාමය ගනුදෙනු පිළිබඳව වාර්තා තබා ගන්නා විශේෂිත ගිණුම්කරණ ප්‍රභේදය මූලාමය ගිණුම්කරණයයි.

# කළමනාකරණ ගිණුම්කරණය

කළමනාකරුවන් වෙත එදිනෙදා සහ කෙටිකාලීන තීරණ ගැනීමේදී අවශ්‍ය කරන නිවැරදි,කාලානුරූපී මූල්‍යමය හා සංඛ්‍යාත්මක තොරතුරු සැපයීම වෙනුවෙන් කළමනාකරණ ගිණුම් හා වාර්තා පිළියෙල කිරීමේ ක්‍රියාවලියයි.

# ගිණුම්කරණ පරිසර සාධක

ගිණුම්කරණ ක්‍රියාවලියට බලපාන පරිසරාත්මක සාධක ගිණුම්කරණ පරිසර සාධක ලෙස හඳුන්වයි.ගිණුම්කරණ පරිසර සාධක 5කි.

1.ආර්ථික හා දේශපාලන පරිසරය

2.ශිල්පීය හා වෘත්තීය පරිසරය

3.නෛතික පරිසරය

4.සමාජ හා සංස්කෘතික පරිසරය

5.තාක්ෂණික පරිසරය

# ආර්ථික හා දේශපාලන පරිසරය

ආර්ථික ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී රජය විසින් ගනු ලබන තීරණ ආර්ථික හා දේශපාලන පරිසරය ලෙස හඳුන්වයි.

<u>විචල්‍යයන්</u>

බදු ප්‍රතිපත්ති

විදේශ විනිමය අනුපාත

මිල මට්ටම්

මූල්‍ය ප්‍රතිපත්ති(පොලී අනුපාත හා වැටුප් පරිමාණ)

වෙළෙඳපල තත්ත්වයන් (මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපල)

# ශිල්පීය හා වෘත්තීය පරිසරය

ව්‍යාපාරය සතු සම්පත් ප්‍රමාණාත්මක හා මූල්‍යමය ආකාරයෙන් මැනීම හා තක්සේරු කිරීම සඳහා ගිණුම්කරණයේදී භාවිතා කරන ක්‍රමවේදයන් සම්බන්ධ පරිසරය ශිල්පීය හා වෘත්තීය පරිසරයයි.

<u>විචල්‍යයන්</u>

ගිණුම්කරණ ප්‍රමිති

ගිණුම්කරණ ශිල්ප ක්‍රම

වෘත්තීය ගිණුම්කරණ ආයතන

# නෛතික පරිසරය

ව්‍යාපාරවල ගිණුම්කරණ භාවිතයන් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නීති රීති,ක්‍රියාපටිපාටීන් නෛතික පරිසරයයි.

විචල්‍යයන්

2007 අංක 07 දරණ සමාගම් පනත

1890 හවුල් ආඥා පනත

දේශීය ආදායම් බදු පනත

ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත

ගිණුම්කරණය හා සම්බන්ධ නඩු තීන්දු

උදා-ගානර් එදිරිව මරේ නඩු තීන්දුව

# සමාජ හා සංස්කෘතික පරිසරය

සමාජයේ වෙසෙන මිනිසුන්ගේ විවිධ චාරිත්‍ර වාරිත්‍ර,විශ්වාස,ආකල්ප හා භාවිතයන් ව්‍යාපාරවලට කරන බලපෑම සමාජ හා සංස්කෘතික පරිසරය නම් වේ.

විචල්‍යයන්

1. ආකල්ප
2. චාරිත්‍ර වාරිත්‍ර
3. පුරුදු
4. විශ්වාස
5. ජනගහනය
6. සංවරණය
7. ජීවන රටාව

# තාක්ෂණික පරිසරය

ගිණුම්කරණ ක්‍රියාවලිය ආශ්‍රිත කටයුතු පහසු කර ගැනීම සඳහා භාවිතයට ගනු ලබන විවිධ වර්ගයේ තාක්ෂණික මෙවලම් තාක්ෂණික පරිසරයයි.

<u>විචලායයන්</u>

පරිගණක තාක්ෂණය

නව උපකරණ භාවිතය උදා-නැනෝ තාක්ෂණය

සන්නිවේදන තාක්ෂණ ක්‍රමවේද

*ටී.ආර්.මාදසේකර මිය*
*ර/ඇහැලියගොඩ ම.ම.වි.*